# සක්විති රජ පදවි ලබා සුගති සම්පත් විඳ නිවන් දකින්නට ධර්ම ශ්‍රවණය කරන්න

## ධම්මසවණිය ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 492 - 495)

පදුමුත්තර බුදු රජාණන් වහන්සේගේ කාලයේ අහසින් ගමන් කළ හැකි තවුසෙක් වාසය කළේය. දිනක් ඔහු බුදු රජාණන් වහන්සේගේ ඉහළින් අහසේ ගමන් කිරීමට තැත් කළ ද එසේ ගමන් කළ නොහැකි ව බිමට වැටුණා.

ඒ වේලාවේ බුදු රජාණන් වහන්සේ දේශනා කළ අනිත්‍යය ඔහු ඉගෙන ගත්තා. මැරෙන මොහොතේ ඔහුට ඒ ධර්ම ශ්‍රවණය සිහි වුණා.

එහි විපාක ලෙස කල්ප තිස් දහසක් දෙව්ලොව වාසය කළේය.

පනස්එක් වරක් දෙව් ලොව රජකම ද කළේය.

සැත්තෑඑක් වරක් සක්විති රජ කම ද දැරුවේය.

අවසානයේ ගෞතම බුදු රජුන්ගේ ශාසනයේ දී අවුරුදු හතක් වැනි වයසක දී අෂ්ට විමෝක්ෂයන් සහ ෂඩ් අභිඥාවන් සහිත ව සිව්පිළිසිඹියා පත් රහතන් වහන්සේ නමක් වූ සේක.